# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 243/14 — 1976 දෙසැම්බර් 17 වැනි සිකුරාදා — 1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව් 68 (70)/76.

(40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනත

අගමැතිගේ නිර්දේශය අනුව මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1976 දෙසැම්බර් මස 17 වන දින,
කොළඹ,
ජනාධිපතිවරයාගේ කාර්යාලයේ දී ය.

### නියෝග

1. මෙම නියෝග හදිසි අවස්ථා (රජය පෙරළීම වැළැක්වීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. කිසිම තැනැත්තකු විසින්, ජාතික රාජ්‍ය සභාවේ කාර්ය පටිපාටිය හෝ යම් අධිකරණයක් ඉදිරිපිට පැවැත්වෙන නඩු කටයුතු මගින් හැර, වාචික ලෙස හෝ හැසිරීමෙන් හෝ කරනු ලබන වෙනත් යම් නිරූපණයකින් ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ එහි යම් විධිවිධානයක වලංගු භාවය ප්‍රතික්ෂෙප කිරීම හෝ වෙනත් යම් අන්දමකින් එයට විරෝධය පෑම හෝ අභියෝග කිරීම හෝ නොකළ යුත්තේ ය:

එසේ වුව ද කවර වූ හෝ ආකාරයකින් ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වලංගු භාවය ප්‍රතික්ෂේප නොකරමින් හෝ එහි වලංගු භාවයට අභියෝග නොකරමින් හෝ එහි වලංගු භාවය ප්‍රශ්න නොකරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි විධිවිධාන සළසා ඇති පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් වෙනස් කිරීමට යමෙකු විසින් උද්ඝෝෂණය කිරීම, මෙම නියෝග යටතේ වරදක් නොවන්නේ ය.

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හෝ එය යටතේ පිහිටුවනු ලැබූ හෝ පත් කරනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ ලෙස හෝ පත් කරනු ලැබූ ලෙස සැළකෙන යම් ආයතනයක හෝ නිලධාරීන්ගේ අධිකාරයට හානිකර ලෙස ක්‍රියා කිරීමට හෝ කවර වූ හෝ ආකාරයකින් විරෝධය පෑමට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සාදනු ලැබූ හෝ පනවනු ලැබූ හෝ පිළිගනු ලැබූ නීතිවලට එරෙහිව හෝ හානිකර ලෙස ක්‍රියා කිරීමට කෙළින්ම හෝ අන් ආකාරයකින් කිසිම තැනැත්තකු විසින් වාචික ලෙස, හෝ හැසිරීමෙන් හෝ කරනු ලබන යම් නිරූපණයකින් යම් තැනැත්තකු පෙළඹවීම, දිරිගැන්වීම ඔහුට අනුබල දීම හෝ නොකළ යුතුය.

3අ. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හෝ එය යටතේ පිහිටුවන ලැබූ හෝ පත්කරනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ ලෙස හෝ පත් කරනු ලැබූ ලෙස සැලකෙන යම් ආයතනයක හෝ නිලධරයන්ගේ අධිකාරයට හානිකර ලෙස ක්‍රියා කිරීමට හෝ කවර වූ හෝ ආකාරයකින් විරෝධය පෑමට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සාදනු ලැබූ හෝ පනවනු ලැබූ හෝ පිළිගනු ලැබූ නීතිවලට එරෙහිව හෝ හානිකර ලෙස ක්‍රියා කිරීමට කෙළින්ම හෝ අන් ආකාරයකින් යම් තැනැත්තකු පෙළඹවීමට, දිරි ගැන්වීමට හෝ ඒ තැනැත්තාට අනුබල දීමට ඉඩ ඇති යම් ලියවිල්ලක් හෝ නිරූපණයක් අඩංගු යම් පොතක්, ලේඛනයක් හෝ පත්‍රයක් හෝ දෙයක් මුද්‍රණය කිරීම හෝ මුද්‍රණය කිරීමට සැලැස්වීම හෝ තම සන්තකයෙහි, භාරයෙහි හෝ පාලනයෙහි තබා ගැනීම හෝ බෙදා හැරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

(2) (1) වන ඡේදය යටතේ කරනු ලැබූ වරදකට අධිකරණයක් විසින් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක ඒ පොත, ලේඛනය, පත්‍රය හෝ දෙය මුද්‍රණය කිරීම සඳහා පාවිච්චි කරන ලද මුද්‍රණාලය හෝ වෙනත් යන්ත්‍ර ශ්‍රී ලංකා ජනරජයට සන්තක වූ ලෙස සලකනු ලැබිය යුතුය.

4. පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් සංවිධානය කරනු ලැබූ රැස්වීමක දී හෝ පිළිගත් දේශපාලන පක්ෂයක, සඟරාවක හෝ ප්‍රවෘත්ති පත්‍රයක පළ කිරීමෙන් හෝ මේ විධිවිධාන යටතේ කරනු ලැබූ වරදකට අධිකරණයක් විසින් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක ඒ දේශපාලන පක්ෂයට නීතිය යටතේ හිමිවන පිළිගත් දේශපාලන පක්ෂයක තත්ත්වය අහිමි වන්නේ ය. තවද,

(අ) ඒ දේශපාලන පක්ෂයට අයත් සියළු චංචල හා නිශ්චල දේපළ ශ්‍රී ලංකා ජනරජය සතු වූ ලෙස සලකනු ලැබිය යුතුය ; තවද,

(ආ) මෙම නියෝග ක්‍රියාත්මක වූ දිනයෙන් පසු ඒ දේශපාලන පක්ෂය විසින් හෝ එම පක්ෂය වෙනුවෙන් එකී දේපළ සම්බන්ධයෙන් කරනු ලැබූ යම් අන්සතු කිරීමක් හෝ වෙනත් යම් බැහැර කිරීමක් අවලංගු හා බල රහිත වූ ලෙස හා අවලංගු හා බලරහිත වන ලෙස සැළකිය යුතුය.

5. මෙම නියෝග යටතේ යම් වරදක් සඳහා යම් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව කරනු ලැබූ දිවුරීමකින් හෝ ප්‍රකාශයකින් බැඳී සිටින අවස්ථාවක, ඒ වරද සඳහා අධිකරණය විසින් නියම කරනු ලබන වෙනත් යම් දඩුවමකට අතිරේකව,—

(අ) ඒ තැනැත්තාගේ සියළු චංචල හා නිශ්චල දේපළ ඒ වරදකරු කිරීම හේතුකොටගෙන, ශ්‍රී ලංකා ජනරජය සතුවූ ලෙස සලකනු ලැබිය යුතුය. තවද,

(ආ) මෙම නියෝග ක්‍රියාත්මක වූ දිනයෙන් පසු ඒ තැනැත්තා ඒ දේපළ සම්බන්ධයෙන් කරනු ලැබූ යම් අන්සතු කිරීමක් හෝ වෙනත් යම් බැහැර කිරීමක් අවලංගු හා බලරහිතවූ ලෙස හා අවලංගු හා බලරහිත වන ලෙස සැළකිය යුතුය.

6. මේ නියෝගවල කාර්යය සඳහා " පෙළඹවීම " යන්නෙහි යම් ත්‍යාගයක් පිරිනැමීම හෝ පොරොන්දුවීම හෝ යම් තර්ජනයක්, දඬුවමක් හෝ දණ්ඩනයක් එල්ල කිරීම ද ඇතුළත් වන්නේ ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී